# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2363/04 - 2023 දෙසැම්බර් මස 18 වැනි සඳුදා - 2023.12.18

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

නිවේදන අංක 1

**(175 වැනි අධිකාරය වූ) වන්දනා ගමන් ආඥාපනත**

ශ්‍රී පාද වන්දනා වාරය - 2023/2024

ඉහත සඳහන් වන්දනා සමය 2023 දෙසැම්බර් මස 26 වැනි දින සිට 2024 මැයි මස 24 දින දක්වා පවත්වන බව මහජනයාගේ දැනගැනීම සඳහා මෙයින් නිවේදනය කරමි.

වන්දනා ගමන් ආඥාපනතේ විධිවිධාන අනුව පහත සඳහන් *ගැසට් පත්‍රවල* ප්‍රසිද්ධ කර ඇති රෙගුලාසි වන්දනා සමය තුළ වලංගුව පවතින බව මහජනයාගේ අවධානයට යොමු කරමි.

1948 අප්‍රේල් මස 30 දාතම හා අංක 9859 දරන *ගැසට් පත්‍රය*
1949 ජූලි මස 22 දාතම හා අංක 10000 දරන *ගැසට් පත්‍රය*
1958 පෙබරවාරි මස 07 දාතම හා අංක 11255 දරන *ගැසට් පත්‍රය*
1961 ජූලි මස 07 දාතම හා අංක 12508 දරන *ගැසට් පත්‍රය*
1962 මාර්තු මස 02 දාතම හා අංක 12947 දරන *ගැසට් පත්‍රය*
2017 සැප්තැම්බර් මස 01 දාතම හා අංක 2034/33 දරන *ගැසට් පත්‍රය*

**වසන්ත ගුණරත්න,**
දිස්ත්‍රික් ලේකම්/දිසාපති,
රත්නපුර පරිපාලන දිස්ත්‍රික්කය.

රත්නපුර දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ දී ය.



*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

නිවේදන අංක 2

## ශ්‍රී පාද වන්දනා වාරය - 2023/2024

1948 අප්‍රේල් මස 30 දාතම හා අංක 9859 දරන *ගැසට් පත්‍රය*, 1949 ජූලි මස 22 දාතම හා අංක 10000 දරන *ගැසට් පත්‍රය*, 1958 පෙබරවාරි මස 07 දාතම හා අංක 11255 දරන *ගැසට් පත්‍රය*, 1961 ජූලි මස 07 දාතම හා අංක 12508 දරන *ගැසට් පත්‍රය*, 1962 මාර්තු මස 02 දාතම හා අංක 12947 දරන *ගැසට් පත්‍රය*, 2017 සැප්තැම්බර් මස 01 දාතම හා අංක 2034/33 දරන *ගැසට් පත්‍රය* යන ලංකාණ්ඩුවේ *ගැසට් පත්‍රවල* පළවූ වන්දනා ගමන් පිළිබඳ රෙගුලාසි කෙරෙහි මහජනයාගේ අවධානය යොමු කරමි. එම රෙගුලාසි හා සම්බන්ධ පහත සඳහන් කරුණු නිවේදනය කරමි.

**01. විශ්‍රාම ශාලා/අම්බලම් යනු**

1.1. ලිහිණිහෙල, පලාබද්දල විහාරස්ථානය, හැරමිටිපාන, ආඩියාමලතැන්න, වර්ණගල, සීතගඟුල, මැදහින්න, ඉඳිකටුපාන යන විශ්‍රාමශාලා/අම්බලම් නවාතැන් ලෙස භාවිතා කළ යුතුය.

1.2. තාවකාලික නවාතැන් සකස් කිරීම හෝ පවත්වාගෙන යාම නොකළ යුතුය.

**02. ගොඩනැගිලි ඉදි කිරීම**

මාගෙන් හෝ බලයලත් නිලධාරියකුගේ ලිඛිත අවසරයකින් තොරව කිසිවකු විසින් හෝ 2023 දෙසැම්බර් මස 26 දින සිට 2024 මැයි මස 24 දින දක්වා කාලය තුළ ස්ථිර හෝ තාවකාලික ගොඩනැගිල්ලක් හෝ නවාතැනක් හෝ වෙළඳසැලක් ඉදිකිරීම නොකළ යුතුය.

**03. යාචකයෝ**

සිරිපා මළුව ප්‍රදේශයේ හෝ අම්බලම්/විශ්‍රාමශාලා ප්‍රදේශයේ කිසිම තැනක දී යාචකයන් විසින් හිඟමන් ඉල්ලීම හෝ ලබා ගැනීම ද කිසිවකු විසින් හිඟමන් දීම හෝ බෙදා දීම ද නොකළ යුතුය.

**04. නෑම සහ සේදීම**

4.1. දැනටමත් වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුව, මධ්‍යම පරිසර අධිකාරිය සහ පළාත් පාලන ආයතන මඟින් හඳුනාගෙන නම් කර ඇති ආරක්ෂිත ස්ථානවල දී හැර දිය නෑම හෝ රෙදි සේදීම නොකළ යුතුය.

4.2. පෞද්ගලික ආයතන මගින් දිය නෑම හෝ රෙදි සේදීම සඳහා පහසුකම් සැලසීමට බලාපොරොත්තු වන්නේ නම් ඒ සඳහා වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුව, පළාත් පාලන ආයතනය සහ මධ්‍යම පරිසර අධිකාරිය වෙතින් විධිමත් පූර්ව ලිඛිත අවසරයක් ලබා ගත යුතුය.

**05. වාහන /ගමන් මාර්ග**

5.1. ප්‍රාදේශීය සභාව හෝ අදාළ පළාත් පාලන ආයතනය විසින් වෙන්කර ඇති ස්ථානවල හැර වෙනත් ස්ථානවල වාහන ගාල් කිරීම හෝ ඇතුළු කිරීම නොකළ යුතුයි.

5.2. වන්දනා සඳහා වෙන්කර ඇති ප්‍රධාන මාර්ග වන්නේ රජමාවත (පලාබද්දල මාර්ගය), හැටන් නල්ලතන්නිය මාර්ගය හා කුරුවිට එරත්න මාර්ගයයි.

**06. පරිසරය හා සනීපාරක්ෂාව**

6.1. වන්දනා මාර්ගයේ හෝ සිරිපා මළුව පරිශ්‍රයේ හෝ විශ්‍රාම ශාලා අවට හෝ පරිසරයට පොලිතීන්, ප්ලාස්ටික් අවිධිමත් පරිදි බැහැර කිරීම නොකළ යුතුයි.

6.2. ශ්‍රී පාද අඩවිය තුළ කිසිම හේතුවක් නිසා ගින්නක් ඇතිවන ආකාරයේ ගිනි මැල සැකසීම හෝ ගිනි දැල්වීම සිදු නොකළ යුතුය.

6.3. වන්දනා වාරය තුළ බැතිමතුන් සඳහා සනීපාරක්ෂක පහසුකම් සැලසීම හා අපද්‍රව්‍ය ඉවත් කිරීමේ කටයුතු පළාත් පාලන ආයතනවලට හා පළාත් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ කාර්යාලයට පවරමි.

6.4. මාර්ගයේ අත්වැට විෂබීජහරණය කිරීමේ වගකීම පළාත් පාලන ආයතන වලට පවරමි.

**07. වෛද්‍ය පහසුකම්**

පෞද්ගලික ආයතන මඟින් පැවැත්වීමට අදහස් කරනු ලබන වෛද්‍ය ප්‍රතිකාර/ප්‍රථමාධාර මධ්‍යස්ථාන සඳහා පළාත් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂකගේ සහ පළාත් පාලන ආයතනයේ පූර්ව ලිඛිත අවසරයන් ලබාගත යුතුයි.

**08. වෙළඳාම සහ දන්සැල්**

8.1. සිරිපා මළුව, විශ්‍රාම ශාලා ප්‍රදේශයන්හි මෙන්ම ගමන් මාර්ගයේ ද සංචාරක වෙළඳාම තහනම්ය.

8.2. මවිසින් හෝ බලයලත් නිලධාරියකු විසින් අවසර දුන් ස්ථානවල හැර පූජා භාණ්ඩ, පූජා වට්ටි, ආහාර ද්‍රව්‍ය හෝ වෙනත් ද්‍රව්‍ය අලෙවි නොකළ යුතුයි.

8.3. මත්පැන්, දුම්වැටි හෝ වෙනත් කිසිදු මත්ද්‍රව්‍යයක් ගමන් මාර්ගවල රැගෙනයාම හෝ වෙළඳසැල් වල තබා ගැනීම, විකිණීම, මිලදී ගැනීම හෝ භාවිතා කිරීම තහනම්ය.

8.4 පිවිසුම් මාර්ගයන්හි දෙපස අවසර දී ඇති ස්ථානවල හැර කිසිදු ස්ථානයක තාවකාලික හෝ ස්ථිර වෙළඳසැල් තැනීම හෝ පවත්වාගෙන යාම හෝ වෙළඳාම් කිරීම නොකළ යුතුය.

8.5. සෑම වෙළඳසැලකම, සෑම ගොඩනැගිල්ලක ම කසළ බඳුන් තැබිය යුතු අතර අපද්‍රව්‍ය සියල්ල එහි බහාලිය යුතුය.

8.6. විකිණීමට තබා ඇති සියලු සකස් කළ ආහාර ද්‍රව්‍ය මැස්සන්ගෙන් ආරක්ෂා වන පරිදි ආවරණ සහිතව රඳවා තැබිය යුතුයි.

8.7. දන්සැල් ලබාදීමේ දී එම කාලය තුළ පවතින සෞඛ්‍ය තත්වයන්ට අනුකූලව එය කළ යුතු අතර ඒ සඳහා මාගේ හෝ බලයලත් නියෝජිතයෙකුගේ පූර්ව අවසරය ලිඛිතව ලබාගත යුතුය.

**09. වසංගත රෝග තත්ත්වයන් තුළ ගතයුතු ක්‍රියාමාර්ග**

රට තුළ පවතින වසංගත රෝග තත්ත්වයන් යටතේ සෞඛ්‍ය අධ්‍යක්ෂ ජනරාල් විසින් කලින් කලට නිකුත් කරනු ලබන නිසි සෞඛ්‍ය මාර්ගෝපදේශ පිළිපදිමින් වන්දනාවේ යෙදීම කළ යුතුය.

**10. ශ්‍රී පාද වන්දනාවේ පැමිණෙන පිරිස් ශ්‍රී පාද මළුව තුළ නවාතැන් නොගෙන වන්දනාකොට නික්ම යා යුතුය.**

**වසන්ත ගුණරත්න,**
දිස්ත්‍රික් ලේකම්/දිසාපති,
රත්නපුර පරිපාලන දිස්ත්‍රික්කය.

2023 දෙසැම්බර් මස 13 වැනි දින,
රත්නපුර දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ දී ය.

EOG 12 - 0263

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.